
# 2 බුදු සිරිත, බුදු ගුණ හා සඟ ගුණ

අපි පළමු වන පාඩමෙන් බුදුරදුන්ගේ ධර්මයෙහි මූලික කරුණු පිළිබඳ ව ඉගෙන ගතිමු. එම කරුණු අප මැනවින් තේරුම් ගත්තා නම් එය යම් පමණකට ධර්මය දැකීමක් හා සමාන ය. එසේ නම් මේ පාඩමෙන් අප උත්සාහ දරනුයේ එම ධර්මය අවබෝධ කොට ලොවට දේශනා කළ බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ ව ඉගෙනීමට ය. එමඟින් අපහට ධර්මය තුළින් බුදුරදුන් දැකීමට ද, බුදුරදුන් තුළින් ධර්මය දැකීමට ද හැකිවනු ඇත.

## 2.1 බුදු සිරිතේ මූලික සිදුවීම්

### 2.1.1 සිදුහත් කුමරුගේ උපත හා මහා අභිනිෂ්ක්‍රමණය



බුදුරජාණන් වහන්සේ උපත ලැබුවේ ක්‍රි.පූ. 6 වන සියවසෙහි උතුරු ඉන්දියාවේ කොසොල් රටට අයත් ශාක්‍ය ජනපදයෙහි අගනුවර වූ කපිල වස්තු පුරයෙහි ය. එහි පාලකයා වූ සුද්ධෝදන රජ හා එතුමාගේ අග මෙහෙසිය වූ මහාමායා දේවිය උන්වහන්සේගේ දෙමාපියෝ වූහ. සිද්ධාර්ථ යනු උන්වහන්සේහට උපතින් දෙන ලද නම වූ අතර ගෞතම (හෙවත් ගෝතම) යනු උන්වහන්සේගේ ගෝත්‍ර නාමය විය. බුද්ධ යනු බුද්ධත්වයට පත්වීමෙන් පසු උන්වහන්සේ හඳුන්වන ලද අයුරුයි.

සිදුහත් කුමරු උපන් විගස පියවර සතක් ගමන් කොට සිංහ නාද පැවැත්වූ බවත් කුමරා දැකීමට පැමිණි අසිත තවුසාගේ හිස මත කුමරාගේ දෙපා පිහිටි කල්හි තවුසා කුමරුන්හට නමස්කාර කොට කුමරු මතු බුදු වන බවට අනාවැකියක් කී බවත් එවිට පිය රජතුමා ද තම පුත් කුමරුට නමස්කාර කළ බවත් කුමරු ඉපිද සත් දිනකින් මව මිය ගිය බවත් ඔබ දන්නෙහි ය. එසේම නම් තැබීමට පැමිණි බමුණන් කුඩා කුමරුගේ අනාගත ජීවිතය පිළිබඳ ව අනාවැකි කී අයුරුත් උපතින් පස් මසක් ගිය තැන පැවැති වප් මගුල් උත්සවයේ දී කුඩා කුමරු භාවනානුයෝගී වූ අයුරුත් එවිට කුමරුගේ පියා දෙවන වරට පුත් කුමරාණන්ට නමස්කාර කිරීමත් පිළිබඳ ව ඔබ දන්නෙහි ය. සිදුහත් කුමරුන්ගේ ළමා කාලය රාජකීය සැප සම්පත් හා ආරක්ෂාව මැද ගෙවී ගිය අතර රජ කුමරකුහට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර කුමරා හදාරන්නට ද ඇත. ඒ බව පැහැදිලි වන්නේ සිදුහත් කුමරු යසෝදරා කුමරිය හා අතිනත ගැනීමේ අවස්ථාවේ දී තම ඥාතීන් ඉදිරියෙහි ස්වකීය ශිල්පශාස්ත්‍ර නිපුණතාව ප්‍රදර්ශනය කළ බැවිනි.

විවාහ දිවියට පත් තරුණ කුමරුන්හට විවිධ ඍතුවලට උචිත පහසුකම්වලින් යුත් මාලිගා තුනක් විය. ඔහුගේ සතුට පිණිස නාටිකාංගනාවෝ හා අනෙකුත් සේවක සේවිකාවෝ ද

රාශියක් වූහ. සියලු සැප සම්පත් මැද කල් ගෙවුව ද සිදුහත් කුමරුන්ගේ සිත ක්‍රමයෙන් මනුෂ්‍ය ජීවිතයෙහි ගැඹුරු ප්‍රශ්න කරා යොමු වන්නට විය. සතර පෙර නිමිති දැකීම යනු හුදෙක් වයසට ගිය කෙනකු, රෝගියකු, මිය ගිය කෙනකු හා පැවිද්දකු කායික ව දැකීම පමණක් නො වේ. ඒ තුළින් සිදුහත් කුමරු දුටුවේ අප මුහුණ දෙන ඉපදීම, වයසට යාම, රෝගීවීම හා මිය යාම (ජාති, ජරා, ව්‍යාධි, මරණ) යන දුක පිළිබඳ ගැටලුවයි. දුක හේතු කොට ගෙන ලෝකයා ඉතා අපහසු තත්ත්වයකට පත්ව ඇති බැවින් එම දුකෙන් මිදීමක් කෙසේ වේ ද යන්න සෙවීමේ තදබල අවශ්‍යතාවක් සිදුහත් කුමරුගේ සිතෙහි නිතර බලපෑවේ ය. අවසන් ප්‍රතිඵලය වුයේ අලුත උපන් පුත් කුමරු, යසෝධරා දේවිය, පියා හා සුළු මව ඇතුළු ඥාතීන් ද සැප සම්පත් ද සියල්ල අතහැර රජ මාලිගයෙන් නික්ම ගොස් සිදුහත් කුමරු පැවිද්දකු බවට පත් වීමයි. සිදුහත් කුමරුන්ගේ මෙම නික්මීමට මහාභිනිෂ්ක්‍රමණය යැයි කියනුයේ එය කාමයන්ගෙන් නික්මීම පිළිබඳ ඉතා දුෂ්කර කාර්යයක් වු බැවිනි.

### 2.1.2 බුද්ධත්වය හා ප්‍රථම ධර්ම දේශනාව

සිදුහත් තාපසතුමා ආළාරකාලාම හා උද්දකරාමපුත්ත නම් ආචාර්යවරුන් වෙත ගිය අයුරුත් ඔවුන්ගේ ඉගැන්වීම්වලින් තෘප්තියට පත් නොවී, ගුරු මග පෙන්වීමකින් තොරව සය අවුරුද්දක් දැඩි තපස්කම් (දුෂ්කර ක්‍රියා) කොට එහි ඇති අසාර්ථක බව තම අත්දැකීමෙන් වටහා ගෙන එය අත්හළ අයුරුත් ඔබ දනිහි. කම් සුවයෙහි ඇලී ගැලී සිටීම (කාමසුඛල්ලිකානුයෝගය) හා ශරීරයට අධික දුක් දීම (අත්තකිලමථානුයෝගය) යන අන්ත දෙකෙහි අසාර්ථකත්වය තම අත්දැකීම් තුළින් දුටු සිදුහත් තාපසතුමා මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමට පටන් ගත්තේ ය. අවසන බෝධිසත්ත්වයන් වහන්සේ වෙසක් පුන් පොහෝ දින අලුයම දුකට හේතුවන කෙලෙසුන් නැමැති මාරයන් පරාජය කොට උතුම් වූ බුද්ධත්වයට පත් වූ සේක.

බුද්ධත්වයට පත්වීම නම් චතුරාර්ය සත්‍ය අවබෝධය හෙවත් බෝධිය ලබා ගැනීම යි. ඒ සඳහා උන්වහන්සේ පිට දී වැඩ සිටි ඇසතු ගසට ද බෝධිය යැයි කියනුයේ බුදුරදුන් එම උසස් ඥානය මෙම ගස යට දී අවබෝධ කළ බැවිනි. බෝධිය ලබා ගැනීම සඳහා භාවනානුයෝගී ව වැඩ සිටි අසුන බෝධිමණ්ඩප හෙවත් බෝ මැඩ යනුවෙන් හඳුන්වනු ලැබේ. වජ්‍රාසනය යනුවෙන් ද එය හැඳින්වෙනුයේ එහි දී වජ්‍රයක් හෙවත් දියමන්තියක් මෙන් විනිවිද යන සුලු ශක්තියෙන් යුත් ඥානය අවබෝධ කොට ගත් බැවිනි.

බුද්ධත්වයෙන් පසු බුදුරදහු සති හතක් බෝමැඩ අවට විවිධ ස්ථානවල විමුක්ති (හෙවත් සිත කෙලෙසුන්ගෙන් මිදීමේ) සුවය විඳිමින් ද ධර්මය මෙනෙහි කරමින් ද කල් ගත කළහ.

| | |
|---|---|
| 1 සතිය | බෝධි පර්යංකය (බුද්ධත්වය ලබා ගත් ඉරියව්වෙන් වැඩ සිටීම) |
| 2 සතිය | අනිමිසලෝචන පූජාව |
| 3 සතිය | සක්මන් කිරීම |
| 4 සතිය | රුවන් ගෙය |
| 5 සතිය | අජපාල නුගරුක |
| 6 සතිය | මුචලින්ද නාරජ සෙවණ |
| 7 සතිය | රාජායතන කිරිපලු රුක |

මෙම සත් සතියෙන් පසු බුදුරදහු තපස්සු හා භල්ලුක යන වෙළෙඳුන් දෙදෙනා විසින් පිළිගන්වන ලද දානය වැළඳුහ. (මේ දෙදෙන බුදුන් හා දහම් සරණ ගිය පළමු (**ද්වේ වාචික** = සරණ දෙකක් පමණක් ගත්) උපාසකවරු ලෙස සැලකෙති.

තමා අවබෝධ කළ ධර්මය ලෝකයා වෙත දේශනා කිරීමේ දැඩි අවශ්‍යතාව පිළිබඳ ව සිතීමේ දී බුදුරදුන්ගේ සිත මුළින් ම මන්දෝත්සාහී පැත්තට නැමෙන්නට පටන් ගති. එසේ වූයේ තමා අවබෝධ කළ ධර්මය හා සාමාන්‍ය ජනතාවගේ කෙලෙස් හරිත මානසිකත්වය අතර ඇති විශාල පරතරය ගැන සිතූ විට ය. ඔවුන් ධර්මය වෙත යොමු කිරීම ගඟක් උඩු අතට හැරවීමක් බඳු බව උන්වහන්සේට පෙනිණි. මෙහි දී සහම්පති නම් මහා බ්‍රහ්මයා පැමිණ ධර්මය දේශනා කරන ලෙස බුදුරදුන්හට ආරාධනා කළේ ය. ලෝකයාගේ සාමාන්‍ය තත්ත්වය පිළිබඳ ව සිතීමේ දී දුෂ්කර සේ පෙනුණ ද. ධර්මය අවබෝධ කර ගැනීමට හැකි පිරිස් සිටින බව බුදුරදුන්හට පෙනී ගිය බැවින් බ්‍රහ්මයාගේ ආරාධනාව පිළිගෙන ප්‍රථමයෙන් ධර්මය දේශනා කිරීම සඳහා පස්වග තවුසන් සොයා ගෙන බරණැස ඉසිපතනයෙහි මිගදායට වැඩියහ. (බරණැස වූ කලී අනාදිමත් කාලයක සිට බමුණන්ගේ ආගමික පූජනීය ස්ථානයක් මෙන් ම ශාස්ත්‍රීය මධ්‍යස්ථානය ද වූ බැවින් බුදුරදුන් තම ප්‍රථම ධර්ම දේශනාව හා ධර්මදූත කටයුතුවල ආරම්භය ද සඳහා එම පරිසරය තෝරා ගැනීම අහඹු සිදුවීමක් බව නො පෙනේ.)

සිදුහත් තවුසාණන් සමඟ එකට දුෂ්කර ක්‍රියාවෙහි යෙදුණු එම ප්‍රතිපදාව කෙරෙහි දැඩි විශ්වාසයක් තබා සිටි පස්වග තවුසෝ බුදුරදුන්ගේ බුද්ධත්වය එකවර ම පිළිගැනීමට මැළි වූහ. එහෙත් බුදුරදුන් ඉතා අවධාරණයෙන් තම චතුරාර්ය සත්‍යය ධර්මාවබෝධය පිළිබඳ ව පැහැදිලි කරන විට ඒ බව ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්හ ට නොහැකි විය. බුදුරදහු පස්වග තවුසන්හට තම ප්‍රථම ධර්ම දේශනය කළහ. (විස්තර සඳහා 1.3 බලන්න.) මෙම දේශනය අවසානයෙහි කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් ඵලයට පත්විය. පස්වග තවුසන්ට අමතරව මෙම ධර්මය අකණිට්ඨක බ්‍රහ්ම ලෝකය තෙක් වූ සමස්ත ලෝකයෙහි දේව බ්‍රහ්මාදි සත්ත්වයන් විසින් අසනු ලැබී ය.

බුදුරදුන්ගේ පළමු දම් දෙසුම **ධම්මචක්කප්පවත්තන** හෙවත් ධර්මය නැමැති චක්‍රය ඉදිරියට ගමන් කරවීම යන අර්ථයෙන් යුතු ය. චක්‍රයෙන් හෙවත් රෝදයෙන් සංකේතවත් වනුයේ රජතුමාගේ බලයෙහි සංකේතය වන යුද්ධ රථය හෙවත් ආඥා චක්‍රයයි. මෙහි දී බුදුරදුන්ගේ ධර්මය නැමැති චක්‍රයෙන් සංකේතවත් වනුයේ දහම් අවබෝධයෙන් ලෝකයා කුසලයට යොමු කරවීමයි.

### 2.1.3 පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය

පස්වග මහණුන් අතුරින් ඉතිරි සතර දෙන ක්‍රමයෙන් බුදුරදුන්ගේ උපදෙස් අනුගමනය කොට සෝවාන් ඵලයට පත් වූ අතර පසුව අනත්තලක්ඛණ සූත්‍රය (අනාත්ම දර්ශනය) අසා සියලු දෙන රහත් බවට ද පත්වූහ. මේ අතර යස නම් කුල පුත්‍රයා සහ ඔහුගේ හිතවතුන් හතර දෙනෙක් ද, ඒ අයගේ හිතවතුන් වූ තවත් පනස් දෙනෙක් ද බුදුරදුන් වෙත පැවිදි ව රහත් වූහ.

මෙසේ ලොව බුදුරදුන් ද ඇතුළුව රහතන් වහන්සේලා සැට එක් නමක් ඇති වූ කල්හි උන්වහන්සේ මෙම හැට නම අමතා “ මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස චාරිකාවෙහි හැසිරෙන්න. එක් මඟකින් දෙදෙනෙක් නොයන්න. **(චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය... මා ඒකේන ද්වෙ අගමිත්ථ)** යනුවෙන් උපදෙස් දී දහම් පණිවුඩය ලොවට දීමට යැවූහ.

බුදුරදහු උරුවෙලා ජනපදය බලා වැඩියේ එවකට සුප්‍රකට ව සිටි උරුවෙල කාශ්‍යප ඇතුළු සහෝදරයන් තිදෙනකුගෙන් යුත් ජටිල නම් ආගමික පිරිසට ධර්මාවබෝධය කරවීම සඳහා ය. මෙම ජටිල පිරිස මගධ ජනපදයෙහි ආගමික නායකයන් ලෙස සිටි බැවින් ඔවුන්හට තම දහම ඒත්තු ගැන්වීම බුදු සසුනෙහි තීරණාත්මක අවස්ථාවක් විය. බුදුරදුන් රහතන් වහන්සේ නමක් ලෙස පිළිගැනීමට මුල දී දැඩි මැළිකමක් දැක්වූ මෙම පිරිසෙහි නායක උරුවෙල කාශ්‍යප ක්‍රමයෙන් බුදුරදුන්ගේ ගුණය කෙරෙහි නතු විය. අවසන සියලු දෙන තම ජටිල ආගමික වේසය බැහැර කොට භික්ෂූන් ලෙස බුදුරදුන් වෙත පැවිදි ව රහත් භාවයට පත් වූහ.

බුදුරදුන් තමාට මීට පෙර හමුව හඳුනා ගෙන සිටි බිම්බිසාර රජුන් හමුවීමට වැඩියේ මෙම දහසක් පමණ ශ්‍රාවක පිරිස ද කැටුව ය. අතිශයින් සතුටු වූ රජ බුදුරදුන් ප්‍රධාන මහා සංඝයාහට වේළුවනාරාමය (හෙවත් උණගස් උයන) පූජා කළේ ය. මෙම ආරාම පූජාව හා රාජකීය සම්බන්ධය බුදුරදුන්ගේ දහම් පණිවුඩය සමස්ත මධ්‍යදේශය පුරා පැතිර යාමේ වැදගත් සාධකයක් විය.

බුද්ධත්වයෙහි සිට අවුරුදු හතළිස් පහක් පුරා බුදුරදුහු තමා අවබෝධ කොට ගත් ධර්මය දේශනා කරමින් දෙව් මිනිසුන්හට නිවන් මග පෙන්වා දීම සඳහා ක්‍රියා කළහ. උන්වහන්සේ විසින් පෙන්වා දෙන ලද මාර්ගය පිළිපැදීමට බොහෝ දෙනා ඉදිරිපත් වූහ. උපතිස්ස හා කෝලිත යන දෙදෙනා බුදුරදුන් වෙත පැවිදි ව සාරිපුත්ත හා මොග්ගල්ලාන යන නම්වලින් අගසවු බවට පත් වූහ. පිප්ඵලි මානවකයා පැවිදි ව පසුව මහා කස්සප හිමියන් බවට පත් විය.

බුද්ධත්වයෙන් පළමු වසර තුළ දී ම තම උපන්බිම වූ කපිලවස්තුපුරයට වැඩි බුදුරදහු රජ මාලිගයෙහි දී පියරජු ඇතුලු පිරිසට දහම් දෙසා ඔවුන් තෙරුවන් සරණ ගිය උපාසක උපාසිකාවන් බවට පත් කළහ. යසෝදරා දේවිය දැකීම සඳහා ඇයගේ මාලිගයට වැඩි බුදුරදහු සසර පුරා ඇය විසින් තමන් වහන්සේ  වෙත දක්වන ලද සෙනෙහස හා අනුකූලතාව අගය කළහ. පසුව ශාසනයෙහි ප්‍රසිද්ධියට පත් වූ භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත හා නන්ද කුමාරවරුන් මෙහි දී පැවිදි වූ අතර කුඩා රාහුල කුමරු ද බුදුරදුන් විසින් පැවිදි කරන ලදී. ශාක්‍යවංශිකයන් පැවිදි වීමෙන් බුදු සසුන තවදුරටත් වර්ධනය විය. බුද්ධත්වයෙන් පස්වන වසෙහි සුද්ධෝදන රජු  බුදුරදුන්ගෙන් බණ අසා රහත් ව පිරිනිවන් පෑවේ ය. ඉන්පසු මහාප්‍රජාපති ගෝතමිය හා යසෝදරාව ද ඇතුලු කාන්තාවන් විශාල පිරිසකගේ ඉල්ලීම මත භික්ෂුණී සමාජය පිහිටුවන ලදී. ඉන් භික්ෂු, භික්ෂුණී, උපාසක හා උපාසිකා යන සිවු පිරිස සම්පූර්ණ වූහ.

පසේනදී කොසොල් රජු, බිම්බිසාර රජු හා උදේනි රජු වැනි රජවරු ද අනාථපිණ්ඩික, මෙණ්ඩක ආදී සිටුවරු ද විශාඛාව වැනි ප්‍රභූ උපාසිකාවෝ ද බුදු සසුනෙහි අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළ අතර ම බොහෝ පරිත්‍යාග ද කළහ. අනාථපිණ්ඩික සිටුතුමා ජේතවනාරාමය පූජා කළ අතර විශාඛාව විසින් පූර්වාරාමය පූජා කරන ලදී. මෙසේ බුදුසසුන ක්‍රමයෙන් ස්ථාවර සංවිධානයක් ලෙස වර්ධනය විය.

අසූ වසක් සම්පූර්ණ වී  බුදුරදුන් පිරිනිවන්පාන අවස්ථාව වන විට මෙම සිවු පිරිස ආධ්‍යාත්මික වශයෙන් ඉතා උසස් මට්ටමකට දියුණු වී සිටියහ. තම ශාසනයෙහි වගකීම පුද්ගලයකුට නොපවරා ධර්ම විනය ශාස්තෘවරයා ලෙස සළකන්නැයි වදාළ බුදුරජාණන් වහන්සේ වෙසක් මස පුර පසළොස්වක පොහෝ දින කුසිනාරා නුවර දී පිරිනිවන් පා වදාළ සේක.

## 2.1.4 සාරාංශය

මෙම පාඩම් ඒකකයෙන් බුදුරදුන්ගේ ජීවිතයෙහි උත්පත්තිය, තරුණ අවධිය හා විවාහය, මහාභිනිෂ්ක්‍රමණය, දුෂ්කර ක්‍රියාව, බුද්ධත්වය, ප්‍රථම ධර්ම දේශනාව, බුදු සසුනෙහි දියුණුව හා බුද්ධ පරිනිර්වාණය යන කරුණු කෙටියෙන් දක්වන ලදී. ඊළඟ ඒකකයෙන් අපි බුදුරදුන්ගේ ජීවිතයෙන් හෙළි වන ගුණ පිළිබඳ ව හදාරමු.

### අභ්‍යාස

1. සත්සතිය පිළිවෙළින් ලියා එහි සුවිශේෂී සිදුවීම් නම් කරන්න.
2. ප්‍රථම ධර්ම දූත පිරිස අමතා බුදුරජාණන් වහන්සේ කළ අවවාදය ලියා දක්වන්න.
3. කිඹුල්වත් නුවර දී සිදු වූ වැදගත් සිදුවීම් පෙළගස්වන්න.
4. සම්බුද්ධ පරිනිර්වාණය ගැන අසන විට, කියන විට ඔබට ඇතිවන හැඟීම් මොනවා දැයි සඳහන් කරන්න.

**පැවරුම්**

1. බුදුසසුනෙහි පළමු රහතන් වහන්සේලා සැට නම ඇති වූ අයුරු දක්වන්න.
2. උත්පත්තියේ සිට බුද්ධත්වය තෙක් බුද්ධචරිතයේ ප්‍රධාන සිදුවීම් පිළිවෙළින් දක්වන්න.
3. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න:

| | | |
|---|---|---|
| i. සිද්ධාර්ථ | ii. අනාවැකි | iii. භාවනානුයෝගී |
| iv. නාටිකාංගනාව | v. අහඹු සිදුවීම | vi. අභිවෘද්ධිය |

## 2.2 බුදු සිරිතෙන් අපේ දිවියට පාඩම්

### 2.2.1 හැඳින්වීම

පසුගිය ඒකකයෙන් අපි බුදු සිරිතෙහි ප්‍රධාන සිද්ධි හැදෑරුවෙමු. මෙම ඒකකයෙන් අප හැදෑරීමට බලාපොරොත්තු වනුයේ බුදුරදුන්ගේ චරිතයේ සිද්ධි තුළින් අප ජීවිතවලට ගත හැකි ආදර්ශ කවරේ ද යනුයි. ශ්‍රේෂ්ඨ චරිතයක් පිළිබඳ ව දැන ගැනීමේ පරමාර්ථය වන්නේ එමඟින් අප ජීවිත ද ශ්‍රේෂ්ඨත්වයට පත් කර ගැනීම ය. බුද්ධ චරිතය අප විසින් හැදෑරිය යුත්තේ එම උදාර පරමාර්ථයෙනි.

බුදුරදුන්ගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ බොහෝ ය. ඒ සියල්ල පිළිබඳ ව අපට මෙහි දී සඳහන් කිරීමට ඉඩ නැත. ඉතා වැදගත් කරුණු කීපයක් පමණක් විමසා බලනු ලැබේ.

### 2.2.2 පැහැදිලි අරමුණ හා නොපසුබස්නා සුලු උත්සාහය

තමා ද ඇතුළු සියලු සත්ත්වයන්හට දුකෙන් මිදීමේ මාර්ගය සෙවීම පිණිස අභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් කුමරුහට තම අරමුණ මුදුන් පත් කර ගැනීම සඳහා ඉතා දැඩි වෙහෙසක් දරන්නට සිදුවිය. එය කිසිසේත් ම පහසු කාර්යයක් නො වී ය.

මුලින් ම ගුරුවරුන් අනුගමනය කොට ඉන් නිවන් අවබෝධය නොලැබෙන බව දැන ගුරුවරුන්ගෙන් ඈත් ව දුකෙන් මිදීමේ මාර්ගය තමා තනි ව ම සෙවීමේ දී සිදුහත් තවුසා අනතුරු ව යොමු වූයේ දුෂ්කර ක්‍රියාවට ය. ශරීරයට හැකිතාක් දුක් දෙමින් දුකෙන් සැප සෙවීම මෙම ක්‍රමය විය. මෙහි දී සිදුහත් තවුසා තුළ තිබූ ධෛර්යය හා කැපවීම කොතරම් ද යත් එතුමා දුෂ්කර වත් පිළිවෙත්හි අන්තයට ම ගියේ ය. එහෙත් සය අවුරුද්දකට පසු එතුමාට පෙනී ගියේ තමා කෙසේවත් තම පරමාර්ථය කරා සමීප වී නැති බවයි. මෙහිදී ද සිදුහත් තවුසාහට ඉතා බැරෑරුම් තීරණයක් ගැනීමට සිදුවිණි. එනම් එතෙක් අනුගමනය කළ දුෂ්කර ක්‍රියා ප්‍රතිපදා මාර්ගයෙන් සමුගැනීම ය. එසේ කිරීම මඟින් එතුමා තමා හා එකට තවුස්දම් පිරූ පස්වග තවුසන් ඇතුළු සියලු දෙනාගෙන් ද ඈත් වන බව එතුමා දැන සිටියේ ය. එහෙත් එතුමාට වැදගත් වූයේ තම ශ්‍රේෂ්ඨ අරමුණ ඉටු කර ගැනීමයි. ඒ සඳහා ඉවහල් නොවන ඕනෑ ම දෙයකින් ඈත්වීම සඳහා ධෛර්යයක් හා පැහැදිලි දැක්මක් එතුමා වෙත තිබුණි. විමුක්ති මාර්ගයේ එතුමා නැවතත් හුදෙකලා විය. මෙය වූ කලී තීරණාත්මක වූත්, නිර්භීත වූත් පියවරක් විය.

මධ්‍යම ප්‍රතිපදාව සිදුහත් තවුසා විසින් තනි ව ම සොයා ගන්නා ලද්දකි. එම මාර්ගය අනුගමනය කළ එතුමා හට තම ආධ්‍යාත්මික ශක්තිය වර්ධනය වන අයුරුත් තමා නිවැරදි මග ගමන් ගන්නා අයුරුත් පැහැදිලි විය. අවසානයේ දී එතුමා එම තීරණාත්මක වෙසක් පුණු පොහෝ දින සන්ධ්‍යාවෙහි ඇසතු රුක මුල සොත්ථිය නම් බමුණා විසින් පිළිගන්වන ලද කුස

තණ අතුරා සකස් කොට ගත් අසුනෙහි හිඳ ගත්තේ 'මගේ ශරීරයෙහි මස් හා ලේ වියළී සම්, නහර හා ඇට පමණක් ඉතිරි වුව ද බුද්ධත්‍වයට නොපැමිණ මෙම අසුනින් නො නැගිටිමි' යන අධිෂ්ඨානය සමගිනි. එසේ හිඳගත් සිදුහත් තවුසාට තමන්ගේ ම සිත තුළ අනාදිමත් කාලයක් පැවැති කෙලෙස් නැමැති මර සෙනඟ සමඟ සටන් කිරීමට සිදුවිය. මේ පිළිබඳ සිදුහත් තවුසාගේ අදහස වූයේ පරාජය ව ජීවත් වීමට වඩා සංග්‍රාමයෙහි දී මිය යාම වඩා අගනේ ය **සංගාමෙ මේ මතං සෙය්‍යො යං චේ ජීවේ පරාජිතෝ** යන්නයි. මෙම නොපසුබස්නා උත්සාහයෙහි ප්‍රතිඵලය වූයේ සිදුහත් තවුසා කෙලෙසුන් නසා උතුම් වූ බුද්ධත්වයට පත්වීමයි. මෙම අසිරිමත් ක්‍රියාදාමයෙන් පැහැදිලි වනුයේ තම අරමුණ ඉටු කර ගැනීමේ කාර්යයෙහි දී සිදුහත් තවුසා තුළ පැවැති පැහැදිලි දැක්ම, ධෛර්යය හා නොපසුබස්නා උත්සාහයයි.

### 2.2.3 කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් පරාර්ථය වෙනුවෙන් කැපවීම

බුදුරජාණන් වහන්සේ තම මුළු මහත් ජීවිතය ලෝක සත්ත්වයා හට නිවන් මග පෙන්වාදීම සඳහා කැප කළ බව ඔබ දන්නෙහි ය. පිරිනිවන්පාන තෙක් ම උන්වහන්සේ වැසි සිවුමස හැරෙන විට මුළු කාලය ගමින් ගමට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට චාරිකාවෙහි හැසිරෙමින් ගත කළ සේක. බුදුරදුන්ගේ චාරිකා, තුරිත චාරිකා හා අතුරිත චාරිකා යනුවෙන් දෙයාකාර වේ. බුදුරදුන් කිසියම් පුද්ගලයකු හෝ පිරිසක් වෙනුවෙන් විශේෂයෙන් දහම් දෙසීමට වැඩම කිරීම **තුරිත** (ඉක්මන්) චාරිකා නම් වේ. **අතුරිත** (නො ඉක්මන්) චාරිකාව නම් බුදුරදුන් භික්ෂූන් සමඟ වැසි නොවසින අටමසක් හෝ නව මස ගම්, නියම්ගම් පිළිවෙළින් චාරිකාවෙහි හැසිරීමයි.

චාරිකාවෙහි හැසිරුන ද නැත ද බුදුරදුන්ගේ දිනපතා ජීවිතය කාලය මැනවින් බෙදා වෙන් කොට ගත් කාල සටහනකට අනුව ගතවිය. පෙර බත් කිස, පසු බත් කිස යනුවෙන් දිවා කාලය දෙකොටසකට බෙදා වෙන් කරන ලදී. දිනකට වරක් පමණක් දානය වැළඳූ බුදුරදුන් දානයට පෙර කළ කටයුතු 'පෙරබත් කිස' නම් විය. බුදුරදහු අලුයම හතරට පමණ පිබිද ශරීර කෘත්‍යය කොට මහාකරුණා සමාපත්තියෙන් ලෝකය දෙස බලා පිහිට විය යුතු සත්ත්වයන් කවුරුන් දැයි තීරණය කරති. හිරු මුදුන් වීමට පෙර දානය වැළඳූ බැවින් ඒ සඳහා පිඬු පිණිස හැසිරීම හෝ ආරාධනය කරන ලද දනක් පිළිගැනීම සඳහා ගමන් කිරීම හෝ පෙර බත් කිසට අයත් විය. ඒ අතරතුර දී අවශ්‍ය කෙනකුහට දහම් දෙසීම ද සිදුවිය. දානයෙන් පසු කටයුතු (පසුබත් කිස) වූයේ මඳ වේලාවක් විවේක සුවයෙන් වැඩ සිටීමත් භික්ෂූන්ට භික්ෂුණීන්ට භාවනා උපදෙස් ලබා දීමත් රැස්වන උපාසක උපාසිකාවන්හට දහම් දෙසීමත් ය.

රාත්‍රි කාලය එක සමාන කොටස් තුනකට බෙදන ලද අතර ඒවායෙහි දී කරන ලද ක්‍රියා පෙරයම් කිස, මැදියම් කිස හා පැසුළුයම් කිස යනුවෙන් වර්ග කරන ලදී. පෙරයම් කිස වෙන්වූයේ බණ ඇසීමට පැමිණෙන උපාසක උපාසිකාවන්හට දහම් දෙසීමට ය. මැදියම් කිස වූයේ දෙව් බඹුනට දහම් දෙසීම ය. පැසුළුයම්හි එක් කොටසක් සක්මනින් ගත කළහ; දෙවන කොටසෙහි සිහි නුවණින් යුතු ව සැතපෙන බුදුරදහු තෙවැනි කොටසෙහි අරහත් ඵල සමාපත්ති සුවයෙන් කල්ගත කළහ. අවසන් කොටසෙහි මහාකරුණා සමාප්තියට සමවැදී ලෝකය දෙස බලා එදින දහම් දෙසිය යුතු පුද්ගලයන් පිළිබඳ ව තීරණය කරති. මෙසේ බුදුරදහු දිනකට පැයක් පමණක් සැතපෙමින් තම ජීවිතය සත්‍වයාහට නිවන් මග කියාදීම සඳහා කැප කළහ.

පිරිනිවන් පාන අවසන් අවස්ථාවේ පවා පැමිණි සුභද්ද නම් පරිබ්බාජකයාහට ආනන්ද හිමියන් වළකද්දීත් තමා සමීපයට ගෙන්වා දහම් දෙසා පැවිද්ද ලබා දුන්හ. (සුභද්ද හිමියන් බුදුරදුන්ගේ අවසන් ශ්‍රාවකයා වූයේ එසේ ය.) තම ජීවිතය අනුන් සඳහා කැප කිරීමේ උදාර ගුණයට අමතර ව මෙයින් හෙළිවන අනිත් අගනා කරුණ නම් බුදුරදුන් පැහැදිලි පිළිවෙළකට අනුව කාලය ගත කරමින් කාලයෙන් උපරිම ප්‍රයෝජනය ගත් අයුරුයි. වාර්තාගත ලෝකයේ නිශ්චිත කාල සටහනකට අනුව දිවි ගෙවූ පළමු වැන්නා බුදුරදුන් විය හැකි ය. උන්වහන්සේ එමඟින් අප සැමට අගනා ආදර්ශයක් සපයන සේක.

### 2.2.4 අවවාදය හා ආදර්ශය

බුදුරදුන්ගේ ජීවිතය දෙස බැලීමේ දී කැපී පෙනෙන ලක්ෂණයක් නම් උන්වහන්සේ ප්‍රකාශ කළ දෑ හා උන්වහන්සේ ක්‍රියා කළ ආකාරය අතර පරස්පර ගැටුමක් / නොගැළපීමක් නො තිබීමයි. උන්වහන්සේගේ මේ ගුණාංගය **යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී** (කියන දේ කරන, කරන දේ කියන) යනුවෙන් ධර්මයෙහි විස්තර කොට ඇත.

බුදුරදුන් දේශනා කළ ධර්මය හා උන්වහන්සේගේ ජීවිතය අතර තිබූ මෙම සමතාව කොතරම් ද යත් තම හැසිරීම පරීක්ෂා කර බලන ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයන්හට උපදෙස් දුන්හ. ධර්මය තුළින් බුදුරදුන් දැකීම හා බුදුරදුන් තුළින් ධර්මය දැකීම යනු යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී ගුණය ම විනා අනෙකක් නො වේ.

### 2.2.5 අටලෝදහමින් නොසැලීම

ලාභ අලාභ, යස අයස ( කීර්තිය අපකීර්තිය), නින්දා ප්‍රශංසා හා සැප දුක් යන අටලෝ දහම විෂයෙහි කම්පා නොවීම බුදුරදුන්ගේ අගනා ගුණයක් විය.

මංගල සූත්‍රයෙහි දී මෙම කරුණ ම :

**ඵුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්ස න කම්පති,**
**අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං.**

යනුවෙන් අටලෝ දහමෙන් නො සැලෙන, ශෝකයෙන් හා කිලුටෙන් තොර නිර්භය මනසක් තිබීම උතුම් වූ මඟුල් කරුණකි යනුවෙන් දක්වා ඇති බව ඔබ දනිති.

බුදුරදුන්ට රජවරුන් සිටුවරුන් වැනි උසස් පිරිස් විවිධ අයුරින් ප්‍රශංසා කළ අතර උන්වහන්සේට නින්දා අපහාස ද ලැබුණි. වරක් අක්කෝස භාරද්වාජ නම් බමුණකු බුදුරදුන්ට බැන අපහාස කළ විට බුදුරදහු ඔහුට මෙසේ කරුණු පැහැදිලි කළහ.

"බමුණ, ඔබගේ නිවසට පැමිණෙන ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද සංග්‍රහයක් ඔවුන් නො පිළිගන්නේ නම් එය ඔබට ම වන්නාක් මෙන් ඔබගේ 'සංග්‍රහය' නො පිළිගන්නා බැවින් එය නැවතත් ඔබට ම වේ."

'වසලයා' යැයි තමාට අපහාස කළ බමුණකුට බුදුරදහු කෙනකු' වසලයකු හෝ බමුණකු වන්නේ ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාවෙන් බව පැහැදිලි කළහ. වරක් බුදුරදුන් ප්‍රධාන මහා සංඝරත්නයට අභූත චෝදනාවක් හේතුවෙන් මිනිසුන් අපහාස කරන්නට වූ විට එම නගරය හැර යමු යැයි ආනන්ද හිමියෝ බුදුරදුන්හට යෝජනා කළහ. එවිට බුදුරදහු මෙසේ වදාළහ:

ආනන්ද, අප වෙනත් නගරයකට ගිය විට එම නගරයෙහි මිනිසුන් ද අපහට ගරහත් නම් අපට එම නගරය ද අතහැර යාමට සිදු වේ. අන්තිමට අපට යාමට නගරයක් මේ මුළු දඹදිව ඉතිරි නො වනු ඇත. මෙම අපහාසය අප මෙම නගරයේ දී ම සමථයට පත් කර ගත යුතු ය.

විවිධ ආගමික විශ්වාස රාශියකින් යුතු සමාජයක බුදුරදුන් තම ශ්‍රාවක පිරිස ද සමග අනුගමනය කළේ **ගැටුම්වලින් තොර සාමකාමී සහජීවන ප්‍රතිපත්තියකි.** හැකිතාක් දෙනකුට ධර්මාවබෝධය කරවීම උන්වහන්සේගේ උත්සාහය වුව ද එමඟින් අනිකුත් ආගමික සංවිධානවලට හානි පැමිණවීමට හෝ අලාභ සිදු කිරීමට හෝ ක්‍රියා නො කළහ. උපාලි නම් සුප්‍රකට ධනවත් සිටුවරයා තමා අනුගමනය කළ ජෛන ආගම අතහැර තෙරුවන් සරණ යාමට ඉදිරිපත් වූ විට බුදුරදුන් ඔහුට උපදෙස් දුන්නේ හොඳින් සිතා බලා එසේ කරන ලෙසත් තෙරුවන් සරණ ගිය ද ජෛන ආගමිකයන්හට කරන ලද සත්කාර නො නවත්වන ලෙසත් ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය

**අනුන්ගේ මතවලට සාවධාන ව ඇහුම් කන් දුන් බුදුරදුන්** ඒවාට ගරු කරමින් තම මතය වෙනස් කළ අවස්ථා බොහෝ ය. පැවිදි ශ්‍රාවකශ්‍රාවිකාවනට පනවන ලද ශික්‍ෂාපද පසුව කරන ලද ඉල්ලීම්වලට අනුව වෙනස් කරන ලද වාර අපමණ ය. භික්‍ෂුණී සමාජය පිහිටුවීමෙහි ලා ආනන්ද හිමියන්ගේ ඉල්ලීම ප්‍රබල හේතුවක් වූ අයුරු ද මෙහි ලා නිදසුනකි. බුදුරදුන් අනුගමනය කළ සාමකාමී සහජීවන ප්‍රතිපත්තිය මෙම කරුණුවලින් පැහැදිලි වේ.

**බුදුරදුන්ගේ කාරුණික බව** මිනිස් තිරිසන් ආදී වෙනසකින් තොරව සියලු සත්ත්වයන් වෙත යොමු විය. තමා මැරීමට උත්සාහ කළ දේවදත්ත හිමි, මිනීමරු අංගුලිමාල, මත්වී උන්වහන්සේට පහරදීමට පැමිණි ධනපාල ඇතු, තම පුත් රාහුල හිමියන් යන සියලු දෙන කෙරෙහි බුදුරදුන්ගේ කරුණාව මෛත්‍රිය එක හා සමාන විය.

**උන්වහන්සේ කොතෙක් නිහතමානී වී ද යත්,** තම ශ්‍රාවක පිරිස රැස් ව සිටි තැනකට පවා උන්වහන්සේ පිවිසියේ උගුරෙන් ශබ්දයක් කොට, දොරට තට්ටු කොට අවසර ලැබුණු පසු ය. බුදුරදුන් හමුවීමට දුර සිට පැමිණි තරුණ පුක්කුසාතිට උන්වහන්සේ හමුවනුයේ දෙදෙනා එකම කුඹල් හලක රාත්‍රියෙහි වැතිර විවේක ගනිමින් සිටය දී ය.

**තම ශ්‍රාවක පිරිස කෙරෙහි බුදුරදුන් තුළ වූ වගකීම පිළිබඳ හැඟීම** කොතරම් ද යත් පිරිනිවන් මංචකයෙහි හිඳිමින් ද කිසියම් සැකයක් ඇතොත් නිරාකරණය කර ගන්නා ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියහ. කිසිවකු ප්‍රශ්න නො අසනු දැක කෙළින් ම තමාගෙන් ඇසීමට අකැමැති නම් මිත්‍රයකු ලවා හෝ එසේ කරන ලෙස ඉල්ලා සිටියහ. මේ අනුව බලන විට බුදුරදුන්ගේ ජීවිතය තුළින් අපට ලබා ගත හැකි ආදර්ශ බොහෝ ය.

### 2.2.6 සාරාංශය

අප මෙතෙක් විස්තර කළ කරුණු අනුව පහත සඳහන් ආදර්ශ බුදුරදුන්ගේ ජීවිතය තුළ කැපී පෙනේ. අපගේ ජීවිතවලට සම්බන්ධ කර ගැනීම සඳහා ඒවා මෙසේ මතක තබා ගන්න.

- නො පසුබස්නා උත්සාහය හා පැහැදිලි අරමුණු ඇති ව ක්‍රියාකිරීම
- යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී ගුණය
- අටලෝ දහමෙන් නොසැලීම
- මහා කරුණාව
- නිහතමානීත්වය
- වගකීම පිළිබඳ හැඟීම
- සාමකාමී සහජීවන ප්‍රතිපදාව

**අභ්‍යාස**

1. අටලෝදහම පිළිවෙළින් ලියන්න.
2. බුදුරදුන්ගේ තුරිත චාරිකා හා අතුරිත චාරිකා අතර වෙනස දක්වන්න.
3. බුදුරදුන්ගේ දින චරියාව පිළිවෙළින් ලියා එය අප ජීවිතයට වැදගත්වන අයුරු පැහැදිලි කරන්න.
4. මෙහි දක්වන ලද බුදු ගුණ අතුරින් ඔබගේ වඩාත් ම සිත් ගත් ගුණය දක්වා ඔබ එසේ කැමැති වීමට හේතු ලියා දක්වන්න.

**පැවරුම්**

1. දහම් දැකීම තුළින් බුදුන් දැකීම හා බුදුන් දැකීම තුළින් දහම් දැකීමත් යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී යන ගුණයත් අතර ඇති සබඳතාව පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
2. පුක්කුසාතිගේ කතා පුවත සොයා දක්වන්න.
3. පහත සඳහන් වචනවල තේරුම් සොයා සටහන් පොතට එකතු කර ගන්න:

| | | |
|---|---|---|
| i. සහජීවනය | ii. විමුක්ති මාර්ගය | iii. ආධ්‍යාත්මික ශක්තිය |
| iv. ශරීර කෘත්‍යය | v. පරිබ්බාජකයා | vi. මංචකය |

## 2.3 පද්මාකාර බුදුසිරිත

### 2.3.1 හැඳින්වීම

පද්මය (පියුම) හෙවත් නෙලුම් මල බෞද්ධ ජීවිතයට බොහෝ සමීප මල් අතරින් එකකි. සිදුහත් කුමරා උපන් විගස පියවර හතක් තැබූ බවත් මහ පොළොවෙන් නෙලුම් මල් හතක් මතු ව එතුමාගේ දෙපා පිළිගත් බවත් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. බුද්ධ කාලයෙහි සිට අද දක්වා බෞද්ධයන් බුදුරදුන්ට ගරු කිරීම සඳහා නෙලුම් මල භාවිත කොට ඇත. පවිත්‍රත්වයෙහි හා සුන්දරත්වයෙහි සංකේතයක් ලෙස බෞද්ධ කලාවෙහි හා බෞද්ධ සාහිත්‍යයෙහි අපට නෙලුම් මල නිරතුරු හමුවේ.



මේ සියල්ලට වඩා මෙහි දී අපට වැදගත් වන්නේ බුදුරදුන්ගේ හා රහතන් වහන්සේගේ විරාගී නික්ලේශී ජීවිතය සංකේතවත් කරනු පිණිස පද්මය යොදා ගෙන ඇති අයුරුයි. බුදුරදුන්ගේ ජීවිතය පද්මාකාර වන්නේ කෙසේ ද, ඉන් අප ජීවිතවලට ලබා ගත හැකි ආදර්ශ කවරේ ද යනු මෙම ඒකකයේ දී අපි හදාරමු.

## 2.3.2 බුදුරදුන් පද්මාකාර වන අයුරු

වරක් බුදුරදහු උක්කට්ඨා හා සේතව්‍යා යන නගර අතර මහා මාර්ගයෙහි වඩින විට විවේකය සඳහා ගසක් මුල මදක් වැඩ හුන්හ. බුදුරදුන්ගේ පිය සටහන් දුටු ද්‍රෝණ නම් බමුණා ඒවායෙහි තිබූ විශේෂ ලක්‍ෂණ අනුව එය මිනිස් පිය සටහන් විය නො හැකි යැයි සිතී ය. එසේ සිතන ඔහුට ගසක් මුල වැඩ සිටින බුදුරදුන් දක්නට ලැබිණි. හෙතෙම උන්වහන්සේ වෙත ගොස් "ස්වාමිනි, ඔබ දෙවි කෙනෙක් ද ගාන්ධර්වයෙක් ද යක්‍ෂයෙක් ද නැතහොත් මනුෂ්‍යයෙක් ද" යනුවෙන් ඇසුවේ ය. බුදුරදහු මේ සෑම ප්‍රශ්නයකට ම 'නැත' යනුවෙන් පිළිතුරු දුන්හ. අනතුරුව තමන් වහන්සේ සත්‍ය වශයෙන් කවුරුන් දැයි ද්‍රෝණ බමුණාට පැහැදිලි කරන බුදුරදහු මෙසේ වදාළහ:

බ්‍රාහ්මණය, නිල් , රතු හෝ සුදු පියුමක් දියෙහි ඉපිද, දියෙහි වැඩී දියෙන් උඩට පැමිණ දිය හා අසම්බන්ධ ව පවතින්නාක් මෙන් මම ද ලොවෙහි ඉපිද, ලොවෙහි වැඩී ලොව හා අසම්බන්ධ ව ලොව ඉක්මවා සිටිමි. බ්‍රාහ්මණය, මා බුදුන් (බුද්ධ) යැයි දැන ගන්න.

**පුණ්ඩරීකං යථා වග්ගු තොයේන නුපලිප්පති,**
**නුපලිත්තෝම්හි ලෝකේන තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ.** (ද්‍රෝණ සූත්‍රය)

ද්‍රෝණ බමුණාට දුන් මෙම පිළිතුරෙන් බුදුරදුන් අදහස් කළේ තමන්වහන්සේ දේව මනුෂ්‍ය ආදි කිසිදු සත්ත්ව කොට්ඨාසයකට අයත් ගති, ලක්ෂණ, පැවැතුම්, සිතුවිලි හා ආකල්ප ආදියෙන් යුක්ත නොවන බවයි. කිසියම් සත්ත්ව කොට්ඨාසයකට අයත් යැයි කීම, නිදසුනක් ලෙස ගතහොත්, කිසියම් සංගමයක සාමාජිකත්වයක් ලබා ගැනීම වැනි ය. සංගමයෙක සාමාජිකයකු එම සංගමයෙහි නීතිරීති මගින් බැඳී සීමාසහිත ව පවතී. එහෙත් සියලු කෙලෙසුන් නැසූ, සියලු බැඳීම් දුරු කළ බුදුරදුන් මුළුමනින් ම නිදහස් ය; උන්වන්සේගේ මනස අපරිමාණය පරිමාණයක් හෙවත් සීමාවක් නැත ; කිසිදු බැඳීමක් නැත. දියෙන් උඩට පැමිණ දිය හා අසම්බන්ධ ව, නො බැඳී පවත්නා වූ පියුමක් වැනි ය. අපරිමාණ වූ මනසකින් යුත් බුදුරදුන්ගේ මහාකරුණාව එක් සත්ත්ව කොට්ඨාසයකට පමණක් සීමා කළ නො හැකි ය.

පියුමෙහි උපමාවෙන් බුදුරදුන් පෙන්වා දෙන්නේ ලොව ඉපිද, ලොව වැඩුණු මනුෂ්‍යයකුහට එම මනුෂ්‍යත්වයේ සීමාවන් පමණක් නොව සියලු සීමාවන් ඉක්මවා ගිය විශ්ව සත්ත්වයකු විය හැකි බවයි. ප්‍රායෝගික ව මෙයින් අදහස් කෙරෙන්නේ කිසිදු ආකාර ජාති කුල ගෝත්‍ර ලිංග වර්ණ ආදී භේදයකින් තොර අපරිමිත ආකල්ප සමුදායක් අපට ඇති කර ගත හැකි බවයි. සියලු සත්ත්වයන්හට මෛත්‍රී කිරීමට අපට හැකි නම් අපගේ ලෝකය සියලු සත්ත්වයන්හට ජීවත් වීමට උචිත සුන්දර ස්ථානයක් වනු ඇත.

වෙසක් පොහොය ගැන කියන මහගම සේකරයන්ගේ ප්‍රබුද්ධ නම් කාව්‍යයෙහි එන පහත සඳහන් වදන්වලින් විවරණය වන්නේ ද මෙම අපරිමිත මානසික තත්ත්වයයි:

වෙසක් පහන්වලින් ගලන
සවණක් ගණ රැසින් වැසී
පොළොව බෙදූ තාප්ප සහ කටු කම්බි ද
මොහොතින් අතුරුදහන් වී ගොසින් ය
ලෝකය තනි යායකි.

### 2.3.3 පවිත්‍ර ජීවිතය හා පියුම

පියුම වූ කලී පවිත්‍රත්‍වයෙහි සංකේතයකි. එය අපවිත්‍ර ලෝකය තුළ පවිත්‍රත්‍වය සංකේතවත් කරයි. පහත සඳහන් ධම්මපද ගාථාවලින් මෙම අර්ථය පැහැදිලි කෙරේ:

| | |
|---|---|
| යථා සංකාරධානස්මිං | උජ්ඣිතස්මිං මහාපථේ |
| පදුමං තත්‍ථ ජායේථ | සුචිගන්‍ධං මනෝරමං (4:15) |
| එවං සංකාරභූතේසු | අන්‍ධභූතේ පුථුජ්ජනේ |
| අතිරෝචති පඤ්ඤාය | සම්මා සම්බුද්ධසාවකො. (4:16) |

මහ මග අසල දමා ලූ කසල ගොඩක පිපෙන සුවඳවත් පියුමක් මෙන් කුණු කසල බඳු අන්‍ධ වූ බාලයන් අතර බුදුරදුන්ගේ ශ්‍රාවකයා ප්‍රඥාවෙන් ඔවුන් පසුබා බබළයි.

අපවිත්‍ර ජලයෙහි හැදී එහි ම වැඩෙන පියුම එම අපවිත්‍ර ජලය හා මඩ හා අසම්බන්ධ ව පවතී. අපවිත්‍ර වූ කසල බඳු වූ ලොව ඉපිද එහි වෙසෙන මුනිවරයා ඉන් අපවිත්‍ර නොවී සුවඳ විහිදුවමින් පවිත්‍ර ව වසයි.

ප්‍රායෝගික ව ගත් කළ මෙයින් අදහස් කෙරෙන්නේ විවිධ ප්‍රශ්න, ගැටුම් හා දූෂණ මැද ජීවත්වීමට සිදුවන අපට සමාජයෙහි ඇති එම දැවලින් අපවිත්‍ර නොවී, ඒ හා සම්බන්ධ නොවී අපගේ පවිත්‍රත්වය ආරක්‍ෂා කර ගැනීමට ශක්තිය තිබිය යුතු බවයි.

### 2.3.4 විරාගී ජීවිතය හා පියුම

බුදුරදුන්ගේ ජීවිතය පියුමක් හා සමාන වන අනිත් අර්ථය වන්නේ පියුමක් මෙන් උන්වහන්සේ සමාජය හා නො බැඳී, නො ඇලී වෙසෙන බවයි. පියුමක් එක් අතකට ඇත්තේ මඩ සහිත දියෙහි ය; අනිත් අතට එය එහි නොවේ. (ඉන් ඉහළට පැමිණ එහි කොටසක් නොවී පවතින බැවිනි.) එමෙන් ම, බුදුරදුන් ද එක් අතකට වෙසෙන්නේ කෙලෙස් සහිත ලෝකයා අතර ය. එහෙත් අනිත් අතට උන්වහන්සේ ඔවුනතරට අයිති නො වන සේක. විරාගය හෙවත් නො ඇලීම උන්වහන්සේගේ ජීවිතයේ මූලික ලක්‍ෂණය වේ. පියුම ජලයෙන් උඩට පැමිණ ජලය හා අසම්බන්ධ ව පවතින්නාක් මෙන් බුදුරදුන්ට ලෝකයෙන් නිදහස් ව, ලෝකය හා නො බැඳී ලෝකයෙන් ඉස්මතු ව පවතින්නට හැකිවන්නේ උන්වහන්සේ ලෝකය හා නො ඇලෙන හා නො ගැටෙන බැවිනි.

පද්මාකාර විරාගී ආකල්පය අපගේ ජීවිතයට එකතු කරගන්නා ප්‍රමාණයට අපට දුක් අඩු වී සැප ලැබේ. බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතයට සියයට සියයකින් ළංවීමට අපට නොහැකි වනු ඇත. එහෙත් ඒ සඳහා උත්සාහ දැරීම සහනය පිණිස හේතු වන බව අපට පැහැදිලි විය යුතු ය.

### 2.3.5 සාරාංශය

බුදුරදුන්ගේ ජීවිතය පද්මාකාර වන අයුරු පිළිබඳ මූලික අදහස් තුනක් මෙම ඒකකයෙන් ඔබ ඉගෙන ගත්තෙහි ය. ඒවා නම් :

i. ලෝකයෙහි කවරාකාර හෝ වර්ග කිරීමකට අයත් නො වී ලෝකයෙහි ඇති ජාති, ආගම් ආදී සියලු සීමා බැහැර කොට විසීම
ii. අපවිත්‍ර ලෝකයෙහි පවිත්‍රව ජීවත්වීම
iii. ඇලීම් හා ගැටීම් සහිත ලෝකයෙහි ඒවායින් තොර ව විරාගී ව විසීම

බුදුරජාණන් වහන්සේ මෙම ආකාර තුනෙන් ම පරිපූර්ණ පද්මාකාර ජීවිතයක් ගත කළ සේක. උන්වහන්සේගේ එම ජීවිතාදර්ශය හැකිතාක් අප ජීවිතවලට එක් කර ගැනීමෙන් අපට ද උන්වහන්සේගේ සැබෑ අනුගාමිකයන් බවට පත් විය හැකි ය.

**අභ්‍යාස**


1. බුදුරජාණන්වහන්සේ ද්‍රෝණ බමුණාට දුන් පිළිතුර උපුටා දක්වන්න.
2. සවනක් ගණ බුදුරැස් නම් කරන්න.
3. යථා සංකාරධානස්මිං.... යන ගාථා සම්පූර්ණ කර අරුත් දක්වන්න.

**පැවරුම්**

1. අද අප ජීවත්වන සමාජය අපවිත්‍රව ඇති ආකාර කීපයක් සඳහන් කරන්න.
2. පද්මාකාර ජීවිතයක් ගත කිරීම අපගේ පෞද්ගලික මානසික සහනයටත් සමාජ සාමයටත් ඉවහල් වන අයුරු පිළිබඳ කෙටි රචනයක් ලියන්න.
3. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න.
   i. පද්මාකාර    ii. පවිත්‍රත්වය    iii. ශ්‍රාවකයා
   iv. මිනිබිරිය/මිනිපිරිය    v. වර්ණභේදය

## 2.4 සඟ ගුණයෙන් යහ ගුණයට

### 2.4.1 හැඳින්වීම



පළමු වන පාඩමෙන් අපි ධර්ම රත්නය පිළිබඳ ව ද මේ පාඩමෙහි මුල් කොටස් තුනෙන් බුද්ධ රත්නය පිළිබඳ ව ද කරුණු දැන ගත්තෙමු. මෙම ඒකකයෙන් බලාපොරොත්තු වන්නේ සංඝ රත්නය පිළිබඳ කරුණු දැන ගැනීමට ය.

බෞද්ධයන් ලෙස අපි ත්‍රිවිධ රත්නය හෙවත් තෙරුවන් සරණ යමු. එසේ සරණ යන්නේ අප සිතෙහි ඇතිවන ශ්‍රද්ධාවත් ප්‍රසාදයත් නිසා ය. (මේ කරුණු පිළිබඳ ව අපි අවසන් පාඩමෙහි දී විස්තර වශයෙන් ඉගෙන ගන්නෙමු.) තෙරුවන් පිළිබඳ ව කරුණු දැනීමෙන් ඇති වන පැහැදීමට **අවේච්චප්පසාද** යැයි කියනු ලැබේ. මෙම පාඩම අවසන් වන විට අපි ත්‍රිවිධ රත්නය ම පිළිබඳ ව කරුණු දැන ගන්නා අතර එමගින් අවබෝධයෙන් යුතු ව තෙරුවන් සරණ ගිය පිරිසක් බවට පත් වන්නෙමු.

### 2.4.2 සංඝරත්නය

'සංඝ' යන පාලි වචනයෙහි තේරුම, සමූහය, පිරිස යනුයි. මෙහි දී අප සංඝරත්නය යැයි කියනුයේ සාමාන්‍ය පිරිසකට නො ව, බුදුරදුන් විසින් පෙන්වා දෙන ලද ධර්මය අනුගමනය කොට සතර මග, සතර ඵල හා නිවන් යන නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය මුළුමනින් හෝ අඩ වශයෙන් හෝ අවබෝධ කළ පිරිසයි. සංඝ රත්නයට වැඳීම සඳහා අප භාවිත කරන 'සුපටිපන්නෝ'ආදි පාඨයෙහි 'සාවකසංඝ' යනුවෙන් සඳහන් වන්නේ මෙම මගඵල අත්පත් කරගත් සංඝ රත්නයයි.

මගඵල ලබාගත් සංඝයා යනු (භික්ෂු, භික්ෂුණී, උපාසක හා උපාසිකා යන) සිවු පිරිසෙන් ඕනෑ ම කෙනෙකු විය හැකි ය. එහෙත් සාමාන්‍යයෙන් මගඵල අත්පත් කර ගැනීමේ අවස්ථාව බොහෝ කොට ම ඇත්තේ පැවිදි පිරිස වෙත බැවින් ද, පැවිදි පිරිසෙන් ද භික්ෂූන් වහන්සේ මූලික වන බැවින් ද, සංඝ රත්නය යනුවෙන් සාමාන්‍යයෙන් ගැනෙන්නේ මගඵල ලබාගත් භික්ෂූන් වහන්සේ ය.

මෙම සංඝරත්නය "අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නය" යනුවෙන් හඳුන්වනු ඔබ අසා ඇත. එහි දැක්වෙන ආර්ය පුද්ගලයන් අට දෙනා නම් සෝවාන්, සකෘදාගාමි, අනාගාමි හා අරහත් යන සතර මාර්ගය හා එම සතර ඵල ද ලබාගත් උතුමන් ය.

### 2.4.3 සඟ ගුණ

සංඝරත්නයට වැඳීම සඳහා අප නිතර භාවිත කරන 'සුපටිපන්නෝ' යනාදී පාඨයෙහි සඟ ගුණ නවයක් සඳහන් වේ.

| | | |
|---|---|---|
| 1. | **සුපටිපන්න** | (බුදුරදුන් විසින් දේශනා කරන ලද) යහපත් ධර්ම මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු |
| 2. | **උජුපටිපන්න** | ඍජු වූ ධර්ම මාර්ගය ඍජු ව හෙවත් අවංක ව අනුගමනය කිරීමෙහි යෙදුණු |
| 3. | **ඤායපටිපන්න** | නිවන සඳහා වන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු |
| 4. | **සාමීචිපටිපන්න** | නිවැරැදි ධර්ම මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු |
| 5. | **ආහුණෙය්‍ය** | ආරාධනා කොට වැඩමවා සිවුපසය පුද කිරීමට සුදුසු |
| 6. | **පාහුණෙය්‍ය** | ආගන්තුකයන් සඳහා සුදානම් කළා වූ ආහාරය වුව ද පිළිගැන්වීමට සුදුසු |
| 7. | **දක්ඛිණෙය්‍ය** | පරලෝ සුව පතා දෙන දානය පිළිගැන්වීමට සුදුසු |
| 8. | **අඤ්ජලිකරණීය** | දොහොත් මුදුන් හි තබා නමස්කාර කිරීමට සුදුසු |
| 9. | **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස** | පින් කරනු කැමැති ලොවැස්සාහට උසස්තම පින්කෙත වූ |

මහා සංඝරත්නයෙහි මෙම ගුණ අතරින් පළමුවන හා දෙවන සුපටිපන්න හා උජුපටිපන්න යන ගුණ පිළිබඳ ව අපි තවදුරටත් විමසා බලමු. 'සුපටිපන්න' නම් යහපත් ධර්ම මාර්ගයට පිළිපන් හෙවත් පිවිසි යන්නයි. යහපත් ධර්ම මාර්ගය යනු ශීල සමාධිප්‍රඥා යන ත්‍රිශික්ෂාව සහිත වූ ප්‍රතිපදාවයි. (මේ පිළිබඳව අපි 1.3 හි සාකච්ඡා කළෙමු.)

'උජුපටිපන්න' යන දෙවන සඟ ගුණයෙන් කියැවෙන ඍජු මාර්ගය අනුගමනය කිරීම යන්න ආකාර දෙකකින් තේරුම් ගත යුතු ය. එනම් ඍජු වූ මාර්ගය අනුගමනය කිරීම හා ඍජු ආකාරයෙන් පිළිපැදීම ද යන ආකාරවලිනි. මුලින් ම ඍජු මාර්ගය යනුවෙන් අදහස් කරනු ලබන්නේ නිවන සඳහා වන නොවරදින මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. දෙවැනි අර්ථයෙන් කියැවෙනුයේ එම මාර්ගය පිළිපදින ආකාරයයි. එනම් ඍජු ව හෙවත් අවංක ව මාර්ගය අනුගමනය කිරීමයි. ශරීරයෙන් වංක ව හැසිරීම (කාය වංක), වචනයෙන් වංක ව හැසිරීම (වචී වංක) හා මනසෙන් වංක ව හැසිරීම (මනෝ වංක) යනුවෙන් වංක හැසිරීම් තුන් ආකාර වේ. මෙම තිදොරින් වංක ව හැසිරීම යනු තිදොරින් දස අකුසල කිරීමයි. (ඒවා කවරේද යනු මීට පෙර දක්නා ලදී.) මහා සංඝරත්නය එබඳු වංක හැසිරීමෙන් බැහැර වූ ඍජු හැසිරීමෙන් යුතු වේ.

අප 'සංඝං සරණං ගච්ඡාමි' යනුවෙන් සරණ යනුයේ මෙබඳු ගුණයන්ගෙන් යුත් මහා සංඝරත්නයයි. අපගේ ආගමික ජීවිතයට අවශ්‍ය ආදර්ශ අපට ලබා ගත හැක්කේ මහා සංඝරත්නයෙනි. මහා සංඝරත්නය අප ආගමික මාර්ගය ආලෝකවත් කරන පහන් කණු වැනි ය. අප බුදුන් වදාළ ධර්ම මාර්ගයෙහි ගමන් කරනුයේ මහා සංඝරත්නය විසින් අපට සපයනු ලබන ආලෝකයෙනි.

මහ සඟ ගුණ විස්තර කෙරෙන **සඟසරණ** නම් ඉපැරැණි සිංහල සාහිත්‍ය කෘතියෙහි සඟ ගුණ හෙළි කරන සිද්ධි රාශියක් අතර අනුරාධපුර යුගයේ ලක්දිව විසූ හිමිනමක් පිළිබඳ පහත සඳහන් සිද්ධිය සඳහන් වේ.

"පෙර ලක්දිව අනුරාධපුරයෙහි කුඩා දරුවෙක් තම මවගේ සහෝදර හිමියන් සමීපයෙහි පැවිදි විය. ධර්මය ඉගෙනීම සඳහා රුහුණට වැඩි කුඩා හිමිනම දිගුකලක් එහි වසමින් ඉගෙනීම කළේ ය. තම ගුරු හිමියන් හා දෙමව්පියන් ද කලෙකින් නොදුටු බැවින් ඔවුන් දැකිය යුතු යැයි සිතා දැන් වැඩිහිටි වියට පැමිණ සිටි හිමියෝ අනුරාධපුරය බලා යාමට පිටත් වූහ. මේ අතර, ඒ හිමියන්ගේ මව ද තම පුතු දිගු කලෙකින් නොදුටු බැවින් රුහුණට වැඩ උන්වහන්සේ කැඳවා එන ලෙස තම සහෝදර හිමියන්ගෙන් ඉල්ලා සිටියා ය. ගුරු හිමියෝ ද ඒ සඳහා රුහුණට වැඩීමට ගමන් ආරම්භ කළහ. දෙදෙනා වහන්සේ අතර මග දී එකිනෙකාට මුණ ගැසුනහ.

සිය ගෝල හිමියන් තම මව්පියන් දැකීමට යන බව අසා සතුටුව අවසර දී ගුරුහිමියෝ වස් වැසීම සඳහා රුහුණ බලා පිටත් වූහ. තරුණ හිමියෝ තම මවුපියන් දායකත්වය දරණ විහාරස්ථානයට පැමිණියහ. දිගු කලකින් නො දුටු බැවින් ඔවුන්ට තම පුත්‍රයා හඳුනා ගැනීමට නො හැකි විය. තම මවුපියන් ඇතුළු දායක පිරිසගේ ආරාධනයෙන් එහි වස් විසූ තරුණ හිමියෝ දිනපතා ඒ පිරිසට දහම් දෙසමින් ඒ අය පින් දහම්හි යොදවමින් වැසි තෙමස එහි විසූහ. වස් විසීම අවසන මවුපියන් ඇතුළු පිරිසට ආශිර්වාද කොට ඔවුන් විසින් පූජා කරන ලද පුද පිරිකර ද රැගෙන උන්වහන්සේ නැවත රුහුණ බලා යාමට පිටත් වූහ. ගුරු හිමියෝ ද රුහුණෙහි වස් වැස අවසන් කොට නැවත අනුරාධපුරය බලා යාමට පිටත් වූහ. නැවත ද දෙන ම අතර මග දී හමුවූහ. තොරතුරු කතා කොට ශිෂ්‍ය හිමියෝ තම මවුපියන් විසින් පූජා කරන ලද පිරිකරවලින් කොටසක් ද ගුරු හිමියන්හට පිදීමෙන් පසු දෙදෙනා වහන්සේ නැවත දෙපැත්තට ගමන් ඇරඹූහ.

තනිව ම වඩිනා තම සහෝදර හිමියන් දුටු උපාසිකාව සෝකයට පත් ව තම පුත් හිමියන් කොහි දැයි විමසුවා ය. සිදු වී ඇති සිද්ධිය තේරුම් ගත් ගුරු හිමියෝ මවු උපාසිකාව ඇතුළු ඥාතීන් සනසා, විහාරයට පැමිණ තෙමසක් වස් වසා නික්ම ගිය තරුණ භික්ෂුව අන් කවරකුවත් නොව ඇයගේ පුත් හිමියන් බව පෙන්වා දුන්හ. තමා වෙත පුද කරන ලද පිරිකර ද පෙන්වූහ. සතුටු කඳුලින් යුතු ව සාදුකාර දුන් උපාසිකාව බුදුරදුන් වැඩ සිටියා නම් තම පුතුගේ අල්පේච්ඡ ගුණය කෙරෙහි සාදුකාර දෙනු ඇතැයි ප්‍රකාශ කළා ය."

මෙම සිද්ධියෙහි සඳහන් තරුණ හිමි නම කොතරම් විරාගී ජීවිතයක් ගත කළා ද යත් තම මවු පියන්හටවත් තමා කවු දැයි හෙළිදරවු කිරීමට අකමැති විය. එහෙත් තම මවු පියන් කෙරෙහි දයානුකම්පාවෙන් ඔවුන් යහපතෙහි යෙදවීමට මැළි නොවී ය. පෞද්ගලික ව ලාභ හෝ ප්‍රශංසා අපේක්ෂාවකින් තොර ව මහා සංඝයා ක්‍රියා කළ අයුරු පිළිබඳ මෙය එක් නිදසුනක් පමණකි.

## 2.4.4 සාරාංශය

මෙම පාඩම් ඒකකයෙන් අපි සංඝ යන්නෙහි අදහස, නව සඟ ගුණ හා සුපටිපන්න හා උජුපටිපන්න යන ගුණ දෙක යන කරුණු ඉගෙන ගත්තෙමු.

මහා සංඝ රත්නය පිළිබඳ ව හැදෑරීමේ දී කැපී පෙනෙන ගුණාංගය ලෙස අපට දැක ගන්නට ලැබුණේ උන්වහන්සේලාගේ ප්‍රතිපත්තිකාමී බවයි. අප එම ගුණ හදාරනුයේ ඒවා අප ජීවිතයට සම්බන්ධ කොට ගැනිම සඳහා ය. ප්‍රතිපත්තිකාමී ජීවිතය ගිහිපැවිදි වෙනසකින් තොර ව අප සියලු දෙනාහට වැදගත් බැවිනි.

### අභ්‍යාස

1. සංඝරත්නයේ ගුණ නමය තේරුම් සහිත ව වගුගත කරන්න.
2. අවෙච්චප්පසාද යන්න පැහැදිලි කරන්න.
3. 'භික්ෂු ජීවිතය පෞද්ගලික අපේක්ෂාවන්ගෙන් තොර වූවකි' මෙහි එන කථාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

### පැවරුම්

1. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න:
   i. ලෝකෝත්තර ii. අන්තර්ගත iii. ප්‍රතිපත්තිකාමී බව
   iv. අල්පේච්ඡතාව v. සදාචාරය
2. අප තෙරුවන් සරණ යන්නේ කවර හෙයින්දැයි පහදමින් ඡේදයක් ලියන්න.
3. භික්ෂූන්වහන්සේ වස් විසීම පිළිබඳව කරුණු සොයා කෙටි රචනයක් ලියන්න.
4. ලෝවැඩ සඟරාවේ එන සංඝරත්නයේ ගුණ සඳහන් පද්‍යය සොයා ලියන්න.

### අතිරේක කියවීම්

1. <u>බුදුහාමුදුරුවෝ</u> (පූජ්‍ය ගනේගම සරණංකර හිමි)
2. <u>පාඨශාලීය සද්ධර්මකෝෂය</u> (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2002)